*සැ. යු.* - 2025.04.17 දින පළ වූ අංක 2433 *ගැසට් පත්‍රයේ* II (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,434 - 2025 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2025.04.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : II (ආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 718 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 719 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 730 |
| රජයේ නොවන දැන්වීම් ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 731 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 මැයි මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 මැයි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

717 - B 082675 — 5,403 (2025/04)
F 1 -

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහජන බැංකුව - මොණරාගල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය**

මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල නගරයේ සිට කොටිගල්හෙල මාර්ගයේ මීටර් 50 ක් දුරින් මාර්ගයට මුහුණලා රූඩ් 01 යි පර්චස් 36.9 ක් විශාල වාණිජ දේපළක් සහ නිවසක් විකිණීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

01. ප්‍රාදේශීය කළමනාකාරිනි - මොණරාගල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා ලද අයදුම් පත්‍රයක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුය.

02. ටෙන්ඩරයට අදාළවන නියමයන් සහ කොන්දේසි ද සමගවන ටෙන්ඩර් අයදුම්පත්‍රය රු. 2000 ක ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් පසු 2025.05.06 වැනි දින දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර වැඩකරන දිනයන්හි දී මොණරාගල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කරනු ඇත.

03. සෑම ටෙන්ඩරයක් සඳහාම අයදුම්පත සමග ආපසු ගෙවනු ලබන රු. 25,000/- ක තැන්පතුවක් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් මගින් මොණරාගල ශාඛාවේ 068100508888888 දරන එක්රැස් කිරීමේ ගිණුමෙහි තැන්පත් කළ යුතුය. ලැබුණු ටෙන්ඩර්පත් ඇගයීමෙන් අනතුරුව කරන ලද එම තැන්පතුව අසාර්ථක ටෙන්ඩර්කරුවන් වෙත ආපසු ගෙවනු ඇත. ඉහළම ලංසුකරු තෝරාගනු ලැබුවහොත් ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දුන් දින සිට දින 10 ක් ඇතුළත ලංසුවෙහි වටිනාකමින් 25% ක් ගෙවීම සහ දින 30 ක් ඇතුළත ඉතිරි මුදල තැන්පත් කළ යුතුය.

04. ටෙන්ඩර් අයදුම්පත්‍රය යථා පරිදි සම්පූර්ණකර, අත්සන් කර, ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "කලුගහලන්ද ඉඩම මිල දී ගැනීම " වශයෙන් ලකුණු කර මුද්‍රා තබන ලද ලිපි කවරයක බහා මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, මොණරාගල වෙත **2025.05.08 වැනි දින ප.ව. 2.00**ට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු හෝ **2025.05.08 වැනි දින ප.ව 2.00** ට පෙර ඉහත කී ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. අදාළ තැන්පතු පත්‍රිකාවල මුල් පිටපත් ටෙන්ඩර් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය.

05. දේපළ පරීක්ෂා කිරීම සහ හිමිකම් සනාථ කර ගැනීමට ප්‍රාදේශීය කළමනාකාරිනි - මොණරාගල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයෙන් දිනය සහ වේලාව පූර්වයෙන් වෙන්කර ගැනීමක් මගින් සිදු කළ හැක.

06. ප්‍රාදේශීය කළමනාකාරිනි විසින් පත් කළ ටෙන්ඩර් ඇගයීම් කමිටුව ඉදිරියෙහි දී මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ දී **2025.05.08 වැනි දින ප.ව. 3.00** ට ටෙන්ඩර් පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට සහ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

ප්‍රාදේශීය කළමනාකාරිනි,
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මොණරාගල.

දු. ක. අංක - 0777237338 / 0715600356 / 0552276347 / 0552276350
ෆැක්ස් අංක - 0552276351

04 - 161

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - පොල්ගහවෙල

රාජසන්තක කරනු ලැබූ හා හිමිකරුවන් හඳුනානොගත් රථ වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණය මගින් රාජසන්තක කරනු ලැබූ හා හිමිකරුවන් හඳුනා නොගත් රථ වාහන **2025.05.09** වැනි දින **පෙ.ව. 8.30** ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රෙජිස්ට්‍රාර්වරියගේ නිසි අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර අදාළ වාහන මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන වාහන එම අවස්ථාවේදී ම මුදල් ගෙවා වෙන්දේසි භූමියෙන් ඉවත් කරගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු අතර, චෙක්පත් ආදිය බාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන ගණුදෙනුකරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීම අනිවාර්යය වේ.

පී. පී. ජේ. ප්‍රනාන්දු,<br>
මහෙස්ත්‍රාත්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය - පොල්ගහවෙල.

2025 අප්‍රේල් මස 04 වැනි දින,<br>
පොල්ගහවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

*උපලේඛනය*

අධිකරණ අමාත්‍යාංශ 08/2013 (11) ප්‍රකාරව

| *අනු අංකය* | *නඩු අංකය* | *වාහන ලියාපදිංචි අංකය/චැසි අංකය* | *භාණ්ඩය* | *වෙනත්* |
|---|---|---|---|---|
| 01 | AR 9884/2019 | WP BAU 3108 | බජාජ් යතුරු පැදිය | - |
| 02 | A 8093/2024 | 14115 | සී ෆැන් අත් ට්‍රැක්ටරය (ට්‍රේලරය නොමැති) | - |
| 03 | A 8093/2024 | LXELGZ4072A 0330273 | යතුරු පැදිය | - |
| 04 | 6897/MISC/13 | NW HQ 0558 | ටිපර් රථය | - |
| 05 | A 7362/2018 | NW MH 9339 | යතුරු පැදිය | - |
| 06 | 13533/PC/2014 | 203 - 2861 | ත්‍රිරෝද රථය | - |
| 07 | 35025/MISE/2019 | 41 - 3265 | බූම් ට්‍රක් රථය | - |
| 08 | 46294/MISE/2022 | NW GR 0008 | බට්ටා ලොරි රථය | - |
| 09 | 19753/E/2016 | NW TI 5954 | බජාජ් යතුරු පැදිය | - |
| 10 | 20190/PC/2016 | WP TK 2348 | බජාජ් යතුරු පැදිය | - |
| 11 | 28593/MISE/2018 | NW SE 6740 | අත් ට්‍රැක්ටරය | - |
| 12 | 18815/MISE/2016 | NW SE 6994 | අත් ට්‍රැක්ටරය | - |

රෙජිස්ට්‍රාර්වරයා නිර්දේශය හා නිල මුද්‍රාව - රාජසන්තක කර ඇති වාහන සම්බන්ධව මෝටර් වාහන පිළිබඳ තක්සේරු මණ්ඩලය මගින් වාර්තා ලබාගෙන ඇත.

04 - 155

**මහෙස්ත්‍රාත් අධිකරණය - අඟුණකොළපැලැස්ස**

මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක කරන ලද වැලි ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීම

අඟුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වූ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපෑ වැලි **2025.05.16 වැනි දින, ප.ව. 1.30** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් වන වැලි පිළිබඳ හිමිකම් දක්වන්නෙකු සිටිනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය යටතේ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත වැලි මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි, එම වැලි වෙන්දේසියේ විකිණීමෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන වැලි සඳහා ඒ අවස්ථාවේ දීම මුදල් ගෙවිය යුතු අතර, එදිනම **ප.ව. 5.00** ට පෙර අදාළ වැලි අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. එසේම සියලු ගෙවීම් මුදලින් සිදු කළ යුතු අතර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් බාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ වැලි මිල දී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් හැඳුනුම්පතක් හෝ ඉදිරිපත් කළ යුතුය.

අයි. පී. අයි. විමල් වීරසිංහ,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - අඟුණකොළපැලැස්ස.

2025 අප්‍රේල් මස 10 වැනි දින,
අඟුණකොළපැලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

*උපලේඛනය*

| *අනු අංකය* | *නඩු අංකය* | *විස්තරය* | *වැලි ප්‍රමාණය* | *වෙනත්* |
|---|---|---|---|---|
| 01 | 13335/25 | වැලි | කියුබ් 03 | |
| 02 | 13333/25 | වැලි | කියුබ් 03 | |
| 03 | 13334/25 | වැලි | කියුබ් 03 | |
| 04 | 13258/25 | වැලි | කියුබ් 03 | |
| 05 | 13034/25 | වැලි | කියුබ් 03 | |
| 06 | 13214/25 | වැලි | කියුබ් 03 | |
| 07 | 12748/25 | වැලි | කියුබ් 3/4 | |
| 08 | 12731/25 | වැලි | කියුබ් 03 | |
| 09 | 13361/25 | වැලි | කියුබ් 04 | |

04 - 156

## මහෙස්ත්‍රාත් අධිකරණය - බණ්ඩාරවෙල

### අධිකරණය වෙත ඉදිරිපත් කර රාජසන්තක කරන ලද භාණ්ඩ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද භාණ්ඩ **2025.05.17** වැනි දින, **පෙ.ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ පූර්ණ අවසරය මත වෙන්දේසිය ආරම්භ වීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරික්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනුන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුවේ.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. මිල දී ගත් සියලුම භාණ්ඩ **ප.ව. 4.00** ට පෙර ඉවත් කර ගත යුතුය.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගන්නා සෑම අයෙකු ම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසිය පවත්වන වේලාවේදී ම එය ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ඒ. පීටර් පෝල්,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය - බණ්ඩාරවෙල.

2025 අප්‍රේල් මස 11 වැනි දින,
බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

*උපලේඛනය*

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *භාණ්ඩ ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | 28128 | (i) 9x9 ප්‍රමාණයේ උදලු<br>(ii) ගල් විදින යකඩ කූරු<br>(iii) අලවංගු<br>(iv) කොහු කඹ<br>(v) තංගුස් ලණු<br>(vi) නිල්පාට ප්ලාස්ටික් බකට් | 02<br>01<br>01<br>03<br>01<br>01 |
| 02 | 50100 | කෘෂි කාර්මික පිහි | 01 |
| 03 | 36262 | උදලු | 01 |
| 04 | 51508 | (i) උදලු<br>(ii) සුදු පාට ප්ලාස්ටික් බකට්<br>(iii) ගැරුම් වට්ටි | 01<br>01<br>01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | භාණ්ඩ ප්‍රමාණය |
|---|---|---|---|
| 05 | 30196 | (i) උදලු<br>(ii) වේවැල් වට්ටි<br>(iii) කලු පාට ප්ලාස්ටික් කෑන්<br>(iv) කපන ලද ප්ලාස්ටික් කෑන් | 01<br>01<br>01<br>01 |
| 06 | 47801 | උදලු | 01 |
| 07 | 34937 | කෘෂි කාර්මික පිහි | 01 |
| 08 | 47883 | උදලු | 01 |
| 09 | 30299 | සවල් | 01 |
| 10 | 30297 | (i) සවල්<br>(ii) බාල්දි | 01<br>01 |
| 11 | 24896 | යකඩ අලවංගු | 01 |
| 12 | 13748 | (i) නිල් පාට ප්ලාස්ටික් බකට්<br>(ii) රෙගියුලේටරය සහිත ගෑස් ලිප්<br>(iii) ලිට්‍රෝ වර්ගයේ 5 kg වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01<br>01<br>01 |
| 13 | 52332 | (i) රතුපාට ප්ලාස්ටික් බකට්<br>(ii) ලාදුඹුරු පාට ප්ලාස්ටික් බේසම් | 01<br>01 |
| 14 | 38917 | (i) වේවැල් කූඩ<br>(ii) ප්ලාස්ටික් බකට් | 01<br>01 |
| 15 | AR 505/24 | චේන් බොලොක් (දම්වැල සහිත) | 01 |
| 16 | 52405 | (i) උදලු<br>(ii) පනිට්ටු | 01<br>02 |
| 17 | 89136 | කොළ පාට ප්ලාස්ටික් භාජන | 01 |
| 18 | 44052 | උදලු | 01 |
| 19 | 47882 | (i) උදලු<br>(ii) හිස් බූලි | 01<br>01 |
| 20 | 48792 | උදලු | 01 |
| 21 | 45046 | උදලු | 01 |
| 22 | 49604 | උදලු තල | 01 |
| 23 | 49128 | උදලු | 01 |
| 24 | 49797 | උදලු | 01 |
| 25 | 51824 | උදලු | 01 |
| 26 | 47612 | කටු කම්බි කැබලි ප්‍රමාණයක් | 01 |
| 27 | 48298 | (i) කැති<br>(ii) රේක්ක<br>(iii) යකඩ කූරු | 01<br>01<br>01 |
| 28 | 30046 | යකඩ කූඩ | 01 |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *භාණ්ඩ ප්‍රමාණය* |
|---|---|---|---|
| 29 | 12387 | ප්ලාස්ටික් බකට් | 01 |
| 30 | 24402 | ගොඩනැගිලි ද්‍රව්‍ය (තහඩු, බොක්ස් බාර්) | |
| 31 | 81852 | (i) විල් බැරෝ<br>(ii) සවල් | 01<br>01 |
| 32 | 20703 | ප්ලාස්ටික් බකට් | 01 |
| 33 | 63681 | නයිලෝන් නූල් | 01 |
| 34 | 40914 | DONG CHENG ගල් විදින යන්ත්‍ර | 01 |
| 35 | 50175 | සවල් | 01 |
| 36 | 88644 | ප්ලාස්ටික් භාජන | 01 |
| 37 | 89049 | (i) කොහු කඹ<br>(ii) පිහි | 01<br>02 |
| 38 | 97952 | කෘෂි කාර්මික පිහි | 01 |
| 39 | 53631 | පොරව | 01 |
| 40 | 85862 | අත් කියත් | 01 |
| 41 | 38291 | (i) පිහි<br>(ii) නයිලෝන් කඹ | 02<br>01 |
| 42 | 23043 | සිලින්ඩරාකාර භාජන | 01 |
| 43 | 39149 | හැමර් | 01 |
| 44 | 11051 | ඇල්කනින් බට රෝල් | 01 |
| 45 | දේ.කු අංක 195/21 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 46 | 33516 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 47 | 22837 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 48 | 21027 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 49 | 50893 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 50 | 50016 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 51 | 53000 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 52 | 4810 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 03 |
| 53 | 53004 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 54 | AR/320/25 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 55 | 23576 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 02 |
| 56 | දේ.කු අංක PR/650/22 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 57 | 44251 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 02 |
| 58 | 44248 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | භාණ්ඩ ප්‍රමාණය |
|---|---|---|---|
| 59 | අංක රහිත | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 60 | දේ. කු. අංක 859/20 | නිල් පාට ප්ලාස්ටික් භාජන | 01 |
| 61 | දේ. කු. අංක 146/20 | නිල් පාට ප්ලාස්ටික් භාජන | 01 |
| 62 | 21989 | නිල් පාට ප්ලාස්ටික් භාජන | 01 |
| 63 | 45175 | දුඹුරු පාට ප්ලාස්ටික් බකට් | 01 |
| 64 | 98522 | නිල් පාට ප්ලාස්ටික් භාජන | 01 |
| 65 | 26979 | කලු පාට ප්ලාස්ටික් බකට් | 01 |
| 66 | අංක රහිත | කලු පාට ප්ලාස්ටික් බකට් | 01 |
| 67 | 47544 | රතු පාට ප්ලාස්ටික් බකට් | 01 |
| 68 | දේ. කු. අංක 2148/21 | නිල් පාට ප්ලාස්ටික් භාජන | 01 |
| 69 | 21302 | සී පැන් ට්‍රැක්ටර් එංජිම | 01 |
| 70 | AR/942/19 | 154-4343 යතුරු පැදි | 01 |
| 71 | 14581 | 126-1013 යතුරු පැදි | 01 |
| 72 | අංක රහිත | අබලන් ස්පීකර් | 08 |
| 73 | AR/2495/24 | විවිධ ප්‍රමාණයේ යකඩ බට හා යකඩ කොටස් | |
| 74 | B/724/6 | (i) JXF - EQ - 355 වර්ගයේ හඬ මිශ්‍රණ<br>(ii) AMIGA වර්ගයේ පරිගනක මොනිටර්<br>(iii) SONY 333ES වර්ගයේ ඇම්ප්<br>(iv) Panasonic වර්ගයේ බෆල්<br>(v) Haier වර්ගයේ රූපවාහිනි යන්ත්‍ර<br>(vi) උස බෆල්<br>(vii) EIKI LC - SB 20 දරන ප්‍රොජෙක්ටර්<br>(viii) නිල් පාට ජෙනරේටර් | 01<br>01<br>01<br>02<br>01<br>02<br>01<br>01 |
| 75 | B/482/06 | Sony වර්ගයේ රූපවාහිනී යන්ත්‍ර | 01 |
| 76 | දේ. කු. අංක 114/06 | (i) රතුපාට වැකුම් ක්ලීනර්<br>(ii) SONY වර්ගයේ බෆල්<br>(iii) PLIPSH වර්ගයේ ලැම්ප් | 01<br>01<br>01 |
| 77 | 38031 | (i) YAMAHA වර්ගයේ කැසට් රෙකෝඩර් | 01 |
| 78 | B/101/06 | (i) Cannon වර්ගයේ Fax යන්ත්‍ර<br>(ii) පිලිප්ස් වර්ගයේ කාර් සෙට් | 01<br>01 |
| 79 | 15624 | වයර් රෝල් | 01 |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *භාණ්ඩ ප්‍රමාණය* |
|---|---|---|---|
| 80 | 94077 | කඹ | 01 |
| 81 | 52249 | i) ගෑස් ලිප්<br>ii) කහ පාට 12.5 kg ගෑස් සිලින්ඩර් | 01<br>01 |
| 82 | 49155 | නිල් පාට 12.5 kg ගෑස් සිලින්ඩර් | 01 |
| 83 | 29880 | බෆල් | 01 |

04 - 164

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොරවක**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මොරවක දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාළව අධිකරණයට ඉදිරිපත් කරනු ලදුව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ **2025.05.17 වැනි දින පෙරවරු 09.30** ට පැරණි මොරවක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ දැක්වෙන හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට (1/2) පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරික්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි මෙම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

06. ගැනුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එච්. එම්. ගිහාන් බස්නායක,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොරවක.

2025 අප්‍රේල් මස 02 වැනි දින,
මොරවක දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

*උපලේඛනය*

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | 29600 | අලවංගු | 01 |
| 02 | 29600 | අලවංගු | 01 |
| 03 | 29600 | අලවංගු | 01 |
| 04 | 29600 | උදළු | 01 |
| 05 | 29600 | අඟල් 07 දිග ගල් කටු | 02 |
| 06 | 29600 | අඬු මිටි | 01 |
| 07 | 29600 | නයිලෝන් කඹ | 02 |
| 08 | 29540 | බැටරි කැබලි 02 සහිත විදුලි පන්දම් | 01 |
| 09 | 28827 | සවල් | 01 |
| 10 | 26512 | අලවංගු | 01 |
| 11 | 26512 | චේන් බ්ලොක් | 01 |
| 12 | 26512 | තංගුස් ලණු | 01 |
| 13 | 26512 | නිල්පාට බාස්කට් | 01 |
| 14 | 26512 | අලවංගු | 01 |
| 15 | 26512 | උදළු | 01 |
| 16 | 26512 | ප්ලාස්ටික් තාච්චි | 01 |
| 17 | AR 2112/24 | නිල්පාට වතුර මෝටරය | 01 |
| 18 | 26618 | කළුපාට පියන සහිත බාස්කට් | 01 |
| 19 | 26618 | පියන සහිත සාස්පාන් | 02 |
| 20 | 27905 | සාස්පාන් | 01 |
| 21 | 27905 | ගෑස් ලිප් | 01 |
| 22 | 27905 | රෙගියුලේටරය සහිත ගෑස් සිලින්ඩර | 01 |
| 23 | 26622 | සාස්පාන් | 01 |
| 24 | 26622 | ගෑස් ලිප් | 01 |
| 25 | 26622 | ගෑස් සිලින්ඩර් | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 26 | 24001 | ගල් විදින හිල්ටි යන්ත්‍ර | 01 |
| 27 | 24001 | ගල් විදින කටු | 02 |
| 28 | 24001 | කුඩා වයර් රෝල් | 01 |
| 29 | 24001 | අලවංගු | 01 |
| 30 | 30894 | වක් පිහි | 01 |
| 31 | 14946 | නිල්පාට ප්ලාස්ටික් කුඩා බැරල් | 01 |
| 32 | 30513 | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 33 | 30232 | ගෑස් සිලින්ඩර් | 01 |
| 34 | 30232 | ගෑස් ලිප් | 01 |
| 35 | 30232 | මන්නා පිහි | 01 |
| 36 | 27496 | ප්ලාස්ටික් බැරල් | 01 |
| 37 | 27496 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 38 | 27895 | ප්ලාස්ටික් බැරල් | 01 |
| 39 | 27895 | ප්ලාස්ටික් බැරල් | 01 |
| 40 | 27895 | ගෑස් සිලින්ඩර් | 01 |
| 41 | 27895 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 42 | 25935 | ගෑස් සිලින්ඩර් | 01 |
| 43 | 25935 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 44 | 25594 | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 45 | 28075 | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 46 | 26539 | නිල්පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 47 | 30666 | ගෑස් සිලින්ඩර් | 01 |
| 48 | 30666 | ගෑස් ලිප් | 01 |
| 49 | 26049 | ගෑස් සිලින්ඩර් | 01 |
| 50 | 20649 | ගෑස් ලිප් | 01 |
| 51 | 25255 | ප්ලාස්ටික් බැරල් | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 52 | 25255 | 5 kg කුඩා ගෑස් සිලින්ඩර් | 01 |
| 53 | 25255 | ලිප් තුනක් සහිත ගෑස් ලිප් | 01 |
| 54 | 29378 | ගෑස් සිලින්ඩර් | 01 |
| 55 | 29378 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 56 | 31049 | නිල් පාට ප්ලාස්ටික් බැරල් | 01 |
| 57 | 31913 | රතු හා කළු පැහැති ඉටි පැදුරු | 01 |
| 58 | අංක රහිත | තෙල් ඉසින යන්ත්‍ර | 01 |
| 59 | අංක රහිත | දොදොල් තාච්චි | 01 |
| 60 | අංක රහිත | නිල් පැහැති කඹ | 01 |
| 61 | අංක රහිත | කොළ පාට කඹ | 01 |
| 62 | අංක රහිත | SONY වර්ගයේ රූපවාහිනී යන්ත්‍ර | 01 |
| 63 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 64 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 65 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 66 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 67 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 68 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 69 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 70 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 71 | අංක රහිත | ඇලුමිනියම් කළ | 01 |
| 72 | අංක රහිත | සවල් | 01 |
| 73 | අංක රහිත | සවල් | 01 |
| 74 | අංක රහිත | සවල් | 01 |
| 75 | 27588 | අලවංගු | 01 |
| 76 | 27588 | උදළු | 01 |
| 77 | අංක රහිත | සවල් | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 78 | අංක රහිත | සවල් | 01 |
| 79 | අංක රහිත | සවල් | 01 |
| 80 | අංක රහිත | සවල් | 01 |
| 81 | අංක රහිත | සවල් | 01 |
| 82 | අංක රහිත | හෙල්මට් | 01 |
| 83 | අංක රහිත | හෙල්මට් | 01 |
| 84 | අංක රහිත | හෙල්මට් | 01 |
| 85 | අංක රහිත | ඉටි පැදුරු | 01 |
| 86 | අංක රහිත | වේවැල් කූඩ | 01 |
| 87 | අංක රහිත | සිවිලින් ෆෑන් (පෙති රහිත) | 01 |
| 88 | අංක රහිත | කුළු ගෙඩි | 01 |
| 89 | අංක රහිත | කුළු ගෙඩි | 01 |
| 90 | අංක රහිත | නිල නිවසින් ගලවා ඉවත් කළ යකඩ ගේට්ටු | 02 |
| 91 | අංක රහිත | වීදුරු බෝතල් තොගයක් | |
| 92 | අංක රහිත | බූලි තොගයක් | |
| 93 | 31320 | වැලි | කියුබ් 01 |
| 94 | 32066 | වැලි | කියුබ් 01 |
| 95 | 31785 | වැලි | කියුබ් 01 |
| 96 | 31744 | වැලි | කියුබ් 01 |
| 97 | 31766 | වැලි | කියුබ් 01 |
| 98 | 32186 | ගෑස් ලිප් | 01 |
| 99 | 32186 | ගෑස් සිලින්ඩර් | 01 |
| 100 | | කවුළු සහිත වානේ රාක්ක (ගලවා කොටස් වශයෙන් ඇත) | 03 |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

**2026 වර්ෂය සඳහා රා තැබැරුම් විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්යෂට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබැරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2026 වර්ෂය තුළ දී පහත දැක්වෙන උපලේඛනයන්හි දැක්වෙන රා තැබැරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් **2025.08.01** දින පෙ.ව. **10.30** දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02\. (අ) සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතුය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත්කර නිල කුවිතාන්සියක් සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩ කඩම් ආදි නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථෝක්ත රා තැබැරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතුය.

a. ටෙන්ඩර් පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය.

b. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතුය.

c. සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

d. සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරමය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3\. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබැරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් විමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4\. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

5\. **ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.**

6\. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින **ප.ව. 2.00** ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය.

7. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත්කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

8. පොරොන්දුවන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

9. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

10. යම් රා තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් **2025.08.29** දින **පෙ.ව. 10.30** ට නැවත මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබාගත හැකිය.

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොත්මලේ.

2025 අප්‍රේල් මස 11 වැනි දින.
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| <u>රා තැබෑරුම්</u><br>අංක 1 කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2025.08.01<br>පෙ.ව. 10.30 | 5000.00 |
| අංක 2 ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය | 2025.08.01<br>පෙ.ව. 10.30 | 5000.00 |
| අංක 3 කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2025.08.01<br>පෙ.ව. 10.30 | 5000.00 |

04 - 165/2

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

**2026 වර්ෂය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් විකිණීම**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්යෂට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බල පවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2026 වර්ෂය තුළ දී පහත දැක්වෙන උපලේඛනයේ දැක්වෙන විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් **2025.08.01 වැනි දින පෙ.ව. 10.30** දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතුය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් සහ,

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩ කඩම් ආදි නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතුය.

a. ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය.
b. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතුය.
c. සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.
d. සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරමය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

5. **ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.**

6. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින ප.ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්ද්‍රකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය.

7. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

8. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

9. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

10. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් **2025.08.29** දින **පෙ.ව. 10.30** ට නැවත මෙම ස්ථානයේදී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. ටෙන්ඩර් විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබාගත හැකිය.

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොත්මලේ.

2025 අප්‍රේල් මස 11 වැනි දින.
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| විදේශ මත්පැන් තැබෑරුම<br>අංක 2 පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය<br>පහල කඩවීදිය | 2025.08.01<br>පෙ.ව. 10.30 | 5000.00 |

04 - 165/1